# සාමාජික සංඛ්‍යාව වැඩි පවුල් ඒකක සඳහා ලබාදෙන දීමනාව

**හැඳින්වීම**

සාමාජික සංඛ්‍යාව වැඩි පවුල් ඒකක සඳහා ලබාදෙන දීමනාව යනුවෙන් අදහස් කරන්නේ ( ගැසට් පත්‍ර අංක 448/1998 වගන්ති අංක 65 ට අනුව) ඔබගේ පවුලේ අවුරුදු 18ට අඩු දරුවන් තිදෙනෙකු හෝ ඊට වඩා සිටීනම් ලබා ගත හැකි දීමනාවකි.

## ඉල්ලුම් පත්‍ර යොමුකිරීමට සුදුසුකම් ලබන්නන්

පහත සඳහන් පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩි පුද්ගලයන්ට මෙම දීමනාව ලබාගැනීමට අයදුම්පත් යොමුකළ හැක:

- ඉතාලිපුරවැසියෙකු හෝ ඉතාලි පුරවැසියෙකුගේ පවුලේ සාමාජිකයෙකුට
- යුරෝපා සංගමයේ පුරවැසියෙකු හෝ පවුලේ සාමාජිකයෙකුට
- සරණාගත හෝ ආරක්ෂණ තත්වය හෝ රැකියාවක් කිරීම මත ඉතාලියේ විසීමේ බලපත්‍රය හිමි විදේශීය පුරවැසියෙකුට

## අයදුම් කලයුතු ආකාරය

අදාල අයදුම්පත **නිසි පරිදි පුරවා** Segrate නගර සභාවේ **සහතිකලත් විද්‍යුත්** තැපැල වන **segrate@postemailcertificata.it** වෙත යොමු කල යුතුයි. ඉල්ලුම් පත්‍රයට තම විසීමේ බලපත්‍රයෙහි පිටපතක් ඇමිණිය යුතු අතර විසීමේ බලපත්‍රය අලුත් කරමින් පවතිනවා නම්, තැපැල් කන්තෝරුවෙන් ලබාදෙන රිසිට් පතෙහි පිටපතක්ද ඇමිණිය යුතුයි. විසීමේ බලපත්‍රය අලුත් කර ඉදිරිපත් කරන තුරු, ඔබගේ අයදුම්පත තාවකාලිකව රඳවා තබා ගනු ඇත. **මෙම ලියකියවිලි රැගෙන නගරසභාව වෙත පැමිණෙන්න එපා.**

මෙම සාමාජික සංඛ්‍යාව වැඩි පවුල් ඒකක සඳහා ලබාදෙන දීමනාව ලබා ගැනීමට නම්, අයදුම්කරුගේ ISEE අගය යූරෝ 8,788.99 ට වඩා අඩු විය යුතුයි.

මෙම දීමනාව සඳහා සුදුසුකම් ලබන්නේ නම්, මසකට යූරෝ 145.14ක් හිමිවෙනු ඇත.

මෙම අයදුම්පත අන්තර්ජාලය හරහා INPS ආයතනයට යොමුකරන අතර, වාර දෙකකට මෙය ඔබට ලැබෙනු ඇත. (ජූලි 15 ට පෙර , ජනවාරි 15 ට පෙර)

**සාමාජික සංඛ්‍යාව වැඩි පවුල් ඒකක සඳහා ලබාදෙන දීමනාව සඳහා 2020 වසර අයදුම්පත් යොමුකිරීම:**

**2020 පෙබරවාරි 1දා සිට 2021 ජනවාරි 31 දක්වා**

**අවශ්‍යතාවයන්**

1. සම්පූර්ණ කරන ලද අයදුම්පත
2. විසීමේ බලපත්‍රයෙහි පිටපතක්
3. බැංකු ගිණුමේ/ තැපැල් ගිණුමේ IBAN අංකය

**යොමුවිය යුතු කාර්යාලය**
සාමාජ සේවා අංශය
වියා ප්‍රීමා මාජ්ජියෝ, 20090, සෙග්‍රාතේ
serviziallapersona@comune.segrate.mi.it